සෘණාත්මක ලේබල්කරණයන් සහ මාධ්‍ය

2020 සහ 2021 වසර වල තෝරාගත් දිනපතා සිංහල භාෂා පුවත්පත් තුළ "කුඩ්ඩා" යන යෙදුම කෙතරම් වාර ගණනක් භාවිතා වී තිබේද යන්න, දත්ත සටහනක් අනුසාරයෙන් මෙසේ දක්වා සිටිමු.

"කුඩ්ඩා" වැනි සෘණාත්මක ලේබල්කරණයන් ලෙස හඳුනාගත හැකි යෙදුම් මාධ්‍ය තුළ නැවත නැවත භාවිතා වීමේ ගැටළුව වන්නේ, එම යෙදුම හා බැඳී ඇති ගර්හාත්මක, නිෂේධනාත්මක අරුත සමගින්, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නවුන් සම්බන්ධයෙන් සමාජය තුළ ඇති කොන් කිරීම වඩ වඩාත් තීව්‍ර වීමයි. ඒ ඔස්සේ, ඔවුනට පුනරුත්ථාපනයෙන් පසුව හෝ නැවත සමාජය හා එක් වීමට බාධක එල්ල වනු ඇත.

එනිසා, "කුඩ්ඩා" වැනි යෙදුම් වෙනුවට, "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුම් වඩාත් උචිත බව සැලකිය හැක.

මත්ද්‍රව්‍ය අවභාවිතයට සහ නීති විරෝධී මත් ජාවාරම ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය ඊයේ දිනයයි (ජූනි 26, 2023).

ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!